

# ජන ගීය . . .

යූ. එම්. නාලනී චන්ද්‍රලතා ජයසේකර
කෘ. ව්‍යා. සේ. ආගරපතන.

රන්වන් රන් ගොයම් කරල් - රන් පාටින් දිලිසෙන විට
රන් දේදුනු රන් දෑකැති - අතට අරන් ගමේ ලියන්
වෙලට ඇදෙනවා //

රන් දෑතේ නටන වළලු - නඟනා සිලි සිලි තාලෙට //
සීපද වාරම් කියමින් - හිමින් හිමින් වෙල් යායෙම
ගොයම් කපනවා //

රං මැණිකේ දෙවට දිගේ - රන් බඳවට සේලෙ ඔතා //
හෙමින් හෙමින් ඔමරි බොමරි - උකුළු මුකුළු පපා ඇඹුල
ඔන්න ගෙනෙනවා //

රන්වන් රන් තරු දහසක් - නෑ රන්වන් සඳ එළියක්
මගේ පැලට අතු අතරින් - එබී බලනවා
එතකොට මට රං මැණිකෙගෙ මුහුණ පෙනෙනවා
සඳවත මැවිලා පෙනෙනවා //